# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 61 — 1973 මැයි 25 වැනි සිකුරාද — 1973.05.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... | 611 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 619 |


**සැලකිය යුතුයි.**—උද්භිද උද්‍යාන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 මැයි 11 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනාගතයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි. දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම් කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත,

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළු නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

5. ඉල්ලා එවූ විට අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලි සියල්ලම හෝ ඒ අකුරින් ඕනෑම එකක් ඉදිරිපත් කළ යුතුය—

(අ) උප්පැන්න සහතිකය

(සැ. යු.—උපකෘත පාඨශාලා සඳහා වූ රෙගුලාසි සංග්‍රහයේ කාර්ය පිණිස නිකුත් කෙරෙන බෞතීස්ම උප්පැන්න සහතිකය භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන කටයුතු භාර අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික සහ

(ඉ) සිංහල සමත් උසස්ම විභාගයේ සහතිකය.

සටහන—

(i) කිසිදු ලියවිල්ලක් හෝ ලියකියවිලි පිටපතක් හෝ ඉල්ලුම්පතට අමුණා නො එවිය යුතුය.

(ii) ඉල්ලා සිටි විට ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

6. රජයේ සේවයෙහි නියුතු නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

7. ඉල්ලුම් පත් හා ඊට සම්බන්ධ වෙනත් යම් ලිපිවේ නම් ඒවා එවිය යුත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස මෙම අමාත්‍යාංශයේ කිසිදු නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වැනි ඡේදයේ මුලින්ම පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි වෙත අවධානය යොමු කෙරේ.

සී. ඒ. කුරේ,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

මුදල් අමාත්‍යාංශය,
මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 මැයි මස 7 දින.

### ආදර්ශ ඉල්ලුම්පත් ආකෘතිය

### නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

(සැ. යු.—ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් කෙලවරේ උඩින්ම "දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත" යන්න සඳහන් කළයුතු අතර, ඉල්ලුම් පත ලියාපදිංචි තැපැලෙන් කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ පිහිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය).

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :—

(2) ලිපිනය :————.

(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහා දැන්විය යුතුය) :—

(3) (අ) උපන් දිනය :—— වර්ෂය :—— මාසය :—— දිනය :——

(ආ) ඉල්ලුම්පත් පියවන දිනට හරි වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.

(4) ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න.
(ලියා පදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :—

(5) උපන් තැන :— (අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඇ) ඉල්ලුම්කරුගේ සීයා :————.
(ඈ) ඉල්ලුම්කරුගේ මුත්තා :————

(6) (අ) ගැහැණු ද පිරිමි ද යන වග :————.

(ආ) විවාහක ද, අවිවාහක ද, සැමියා හෝ බිරිය මියගොස් සිටිද යන්න සඳහන් කරන්න :—

(7) පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය :—

(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

(8) වයස අවුරුදු 12 සිට අධ්‍යාපනය ලැබූ පාසැල්, විදුහල් හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය පාසැල/විදුහල සිට දක්වා | වෘත්තීය අධ්‍යාපනය ආයතනය සිට දක්වා |
|---|---|
| (1) | (1) |
| (2) | (2) |
| (3) | (3) |

(9) ඔබ මුදල් කරදරවලින් නිදහස් ද :————.
නො එසේ නම් ඔබගේ වගකීම් කොපමණද :————.

(10) ඔබ සාපරාධි වරදකට උසාවියකදී චෝදනා ලබා තිබේද ?
එසේ නම්, නඩු අංකය හා දිනයත් ද සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

(11) අධ්‍යාපන, වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් (ලබා ඇති සියලුම උපාධි, විශිෂ්ඨතා, වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් යනාදිය දින ද, පන්ති කිසිවක් ලදදේ නම් ඒවාද, ගත් ගත් විෂයයන් හා ආයතනවල නම් පිළිබඳ විස්තර කරුණා කර සපයන්න :—

(12) වර්තමාන රැකියාව හා ඉහත දී යම් පත්වීම් දැරුයේ නම් ඒවා :—

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |

(රජයේ යටතේ සේවය නතර කිරීමට හේතුව 13 කොටු වෙහි සඳහන් කළ යුතුය).

(13) වැඩිපුර විස්තර කිසිවක් වේ නම් ඒවා :————.

(14) තමා චරිත සහතික ලබාගෙන තිබෙන තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා පදවි :————.

මෙම ඉල්ලුම්පතෙහි මා සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් මෙයින් ප්‍රකාශ කරමි. ඉදින් මෙහි ඇතුලත් විස්තර කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය යැයි අනාවරණය වුවහොත් තෝරාගනු ලැබීමට පෙර නම් මා නුසුදුස්සකු විමට ඉඩ ඇති බවද, පත්කරනු ලැබීමෙන් පසුව නම් කිසිදු වන්දියක් රහිතව මා සේවයෙන් පහකරනු ලැබීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(අපේක්ෂකයා රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව).

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

5-414—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය.

---

### අධිකරණ සේවා උපදේශක මණ්ඩලය

### ගම්බද උසාවි සභාපති තනතුර

අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් ගම්බද උසාවි සභාපති තනතුරුවල දැනට පවත්නා පුරප්පාඩු දෙකක් පිරවීම සඳහා ද තවදුරටත් ඇතිවන පුරප්පාඩු එසේ ඇතිවන පරිදි හා ඇතිවන විට පිරවීම සඳහාද සිංහල භාෂාව පිළිබඳ මනා දැනීමකින් යුත් නීතිඥයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සංලක්ෂ්‍යය.—(i) අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘතිවල පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යන්න ඉතා පැහැදිලිව සඳහන් කොට 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූ, තම ලිපිනය ලියනු ලද් ආවුද මුද්දර නොගැසූ වාවූද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය.

(iii) ගම්බද උසාවි සභාපති තනතුර සඳහා 1972 ඔක්තෝබර් මසදී අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයට භාජන කරන ලද අයදුම්කරුවන් නැවත ඉල්ලුම් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් මෙකී තනතුරට පත් කිරීම සඳහා නැවත සලකා බැලීම ගැන කැමැත්තේ නම් ඒ බව මා වෙත දන්විය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. තෝරා ගනු ලැබූ අයදුම්කරු විසින් තම වැටුපෙන් සියයට 6 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර රජය විසින් සියයට 9 ක් ඒ සඳහා ගෙවනු ඇත. පත්වීම අවුරුදු තුනක (3) පරිවාස කාලයකට

යටත් වන අතර අධ්‍යයන පොදුසහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී සිංහල භාෂා විෂයයන් සම්මාන සාමාර්ථයකට පහළ නොවන තත්ත්වයේ අධ්‍යාපන සුදුසුකමක් නොලබා ඇත් නම් මේ කාලය තුළ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**3. වැටුප් සහ දීමනා.**—තෝරා ගනු ලබන අයදුම්කරුට වැටුප් ගෙවනු ලබන්නේ රු. 360 වාර්ෂික වැටුප් වැඩිවීම් 12 කින් යුත් රු. 8,880 ට හා රු. 9,960 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමන්විතවූ වර්ෂයකට රු. 6,720 කින් පටන් ගෙන වර්ෂයකට රු. 11,040 තෙක් වැඩිවන ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මතය.

4. නිවාඩු සහ සෙසු කොන්දේසි අදාලවන්නේ රාජ්‍ය සේවාවට බැඳෙන නවකයන් සම්බන්ධයෙන් වූ රෙගුලාසි අනුවය.

5. මේ තනතුර දැරීමට සෞඛ්‍ය අතින් තමන් යෝග්‍ය බැව් ඔප්පු කිරීම සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු අතර ගම්බද උසාවි සභාපති වශයෙන් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කරනු ලැබීමටද යටත් විය යුතුය.

6. පත්වීම අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබේ.

**7. සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර—

(අ) නීතිඥයෙකු හෝ අධි නීතිඥයෙකු හා

(ආ) වයස අවුරුදු 47 ට නොවැඩි විය යුතුය.

8. පහත සඳහන් ලියකියවිලි වලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියමකළ විටෙක, ඒවා අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උසස් ම අධ්‍යාපන සහතිකය සහ

(ඇ) සිංහල සහ දෙමළ භාෂා වලින් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

10. ඉල්ලුම්පත්‍ර හා ඒ සම්බන්ධ අනිකුත් ලියකියවිලි එවිය යුත්තේ අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙතය. ඒවා කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

11. ඉල්ලුම්පත්‍ර ලැබුන බව දන්වා එවනු ලැබේ. කිසියම් අයදුම් කරුවකුට දින 14 ක් ඇතුළතදී ඉල්ලුම් පත්‍රය ලැබුන බව දන්වා එවනු නොලැබුවහොත් ඔහු විසින් ඒ බව අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්වෙත දැන්විය යුතුය. මේ අනුව ක්‍රියා කිරීමට අසමත් වීමෙන් අයදුම්කරු පිළිබඳව සලකා බලනු ලැබීම සඳහා ඇති අයිතිය ඔහුට අහිමි වේ.

12. අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අයදුම්කරුවන් එකී පරීක්ෂණයට පැමිණිය යුත්තේ ස්වකීය වියදමිනි.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

1973 මැයි මස 08 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 5.

5–660—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ලොරි රියැදුරු තනතුරු

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ලොරි රියැදුරු තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම් කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතිය ප්‍රකාර සැලකිය යුතු අයදුම්පත් 1973 ජූනි මස 09 වෙනි දිනට පෙර තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**2. වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 3,120—14×60—රු. 3,960.

3. 1973 ජූනි මස 09 වෙනි දිනට වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—**

(අ) අයදුම්කරුවන් 7 වෙනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුතුයි ;

(ආ) ඔවුන්ට සියළුම වර්ගවල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් සහ රිය පැදවීම පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 5ක පළ පුරුද්දක් තිබිය යුතුයි ;

(ඇ) අයදුම්කරුවන් මනා දේහයකින් යුක්ත විය යුතුයි ;

(ඈ) රථ පැදවීම පිළිබඳ නොකැළැල් සහතිකයක් තිබිය යුතුයි ;

(ඉ) මෝටර් යාන්ත්‍රික වැඩ ගැන මූලික දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

5. අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට හා රිය පැදවීමේ යෝග්‍යතා පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අවශ්‍ය සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ට ඒ සඳහා දිනයත්, වේලාවත් පසුව දැනුම් දෙනු ලැබේ. මේ සඳහා වියදම් කිසිවක් නොගෙවනු ලැබේ.

6. වෙනත් දෙපාර්තමේන්තුවල සහ සංස්ථාවල අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත දෙපාර්තමේන්තු හා සංස්ථාවක ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි.

7. ඉහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. ඩී. ඇස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

### ආදර්ශ අයදුම් පත්‍රය

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ලොරි රියැදුරු තනතුරු

1. අයදුම්කරුගේ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. 1973 ජූනි මස 09 දිනට වයස : අවු. :———, මාස :———, දින :———.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. සෑම වර්ගයකටම අයත් රථවාහන පැදවීම පිළිබඳ බලපත්‍රයක් තිබේද ? එසේ නම් බලපත්‍ර අංකය හා කාල සීමාව :———.
7. වාහන පැදවීම පිළිබඳ නොකැළැල් සහතිකයක් තිබේද ?

මවිසින් සපයා ඇති ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–600—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## නව රබර් සැකසුම් ඒකකය

### පුරප්පාඩු

ව්‍යාපාරික ක්ෂේත්‍ර නිලධාරි තනතුර සඳහා ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

**2. වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6,720—12×360—11,040.

**3. වයස.**—අවුරුදු 35 ට අඩු විය යුතුයි.

**4. සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම උපාධිය මනා ඉංග්‍රීසි දැනුමක් ඇති අය ගැන අනුග්‍රහකව සලකා බලනු ලැබේ.

**5. රාජකාරි.**—තෝරා ගනු ලබන අපේක්ෂකයා රබර් වැවෙන පෙදෙස්වල ක්ෂේත්‍ර පරීක්ෂණවල යෙදිය යුතුය. ඔහු ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රවරයා යටතේ සේවය කළ යුතුය. තවද ඔහු යටතේ සේවය කරන අනිකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පාලනය කළ යුතුය.

**ඇ. යු.**—තෝරා ගනු ලබන අපේක්ෂකයා, පලපුරුද්ද හා සුදුසුකම් අනුව සුදුසු වැටුප් පරිමාණයෙහි යොදනු ලැබේ.

**6. සාමාන්‍ය.**—(1) තෝරා ගනු ලබන්නා අවු. 3 ක් ආධුනිකයෙකු ලෙස සේවය කළ යුතු අතර, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ වගන්තිවලට අනුකූලත්වය දැක්විය යුතුය.

(2) රාජ්‍ය රබර් නිෂ්පාදන සංස්ථාව පිහිටුවීමෙන් පසු ස්ථිර කරන තුරු තනතුර තාවකාලික ලෙස සලකනු ලැබේ.

(3) තෝරා ගනු ලබන්නා පඩියෙන් සියයට 6 ක් ගෙවන සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයෙකු විය යුතුය. ඒකකය විසින් ඊට අමතරව සියයට 9 ක් පරිත්‍යාග කරනු ලැබේ.

7. සියළුම ඉල්ලුම් පත්‍ර 1973 ජූනි මස 15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂක, නව සැකසුම් රබර් ඒකකය, 127, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

8. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ ආධාර පාසල් වල නිති ඊනි උදෙසා නිකුත් කළ සහතික පිළිගනු නො ලැබේ.)
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.
(3) ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

9. ඉල්ලුම්පත්‍ර බහා එවන ලිපි කවරවල වම් කෙළවරේ "ව්‍යාපාරික ක්ෂේත්‍ර නිලධාරි තනතුර" යන්න සඳහන් කළ යුතුයි.

10. රජයේ සේවයේ, රාජ්‍ය සංස්ථා හෝ වෙනත් එවැනි ආයතන වල නියුක්ත වූවන්ගේ ඉල්ලුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථා ප්‍රධානීන් වෙතින් ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම්කරු තෝරා ගනු ලැබුවහොත් ආයතනයෙන් මුදවා හැරීමට ප්‍රධානියා කැමති බව පැහැදිලි ලෙස සඳහන් කළ යුතුවේ.

11. ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නො ලැබේ.

12. තනතුර ලබා ගැනීමට කරණ බලපෑම් තනතුරට නුසුදුස්සෙකු ලෙස සැලකීමට හේතු වනු ඇත.

අධ්‍යක්ෂක,
නව සැලසුම් රබර් ඒකකය.

127, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2,
1973 මැයි 14 වන දින.

5-640—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය නියෝජ්‍ය (ගමනාගමන) තනතුර, යාගොඩ

ප්‍රධාන දුම්රිය මාර්ගයේ ගණේමුල්ල හා ගම්පහ යන දුම්රිය ස්ථාන අතර පිහිටුවා ඇති යාගොඩ නියෝජ්‍යස්ථානයේ නියෝජිත (ගමනාගමන) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අඩුම කොමිස් දීමනාව රු. 160 කි.

අයදුම් කළ හැක්කේ පිරිමි අපේක්ෂකයින්ට පමණකි. ඔවුන් මෙම නියෝජ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ එහි නිත්‍ය අයිතිවාසිකම් ඇත්තවුන් හෝ පළාත්වාසීන් විය යුතුය. එසේම ඔවුන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි වූවන් විය යුතුය.

අයදුම්කරුවන් යටත් පිරිසෙයින් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.

කොළඹ 10, මරදානේ, ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සාමාන්‍යාධිකාරි වෙතින් ලබාගත හැකි ඉල්ලුම් පත් නිසි පරිදි සම්පූර්ණකර 1973. 06. 12 වැනි දිනට හෝ ඊට පෙර, ඔහු වෙත ලැබෙන්න සැලැස් විය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා සෑම අයදුම්කරුවකු විසින්ම 9"×4" ප්‍රමාණයේ මුද්දර නොගැසූ තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවිය යුතුය. පිටත කවරයෙහි වම් පස මුදුනෙහි "දුම්රිය නියෝජිත (ගමනාගමන) තනතුර, යාගොඩ සඳහා අයදුම්පත" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

තවදුරටත් විස්තර අවශ්‍යනම්, දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයෙන් හෝ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයන්හි පළ කෙරෙන දැන්වීම් මඟින් ලබා ගත හැකි වනු ඇත.

වී. තී. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

5-607/1—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය නියෝජිත (ගමනාගමන) තනතුර, රිච්මන්ඩ් කන්ද

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගිංතොට හා ගාල්ල යන දුම්රිය ස්ථාන අතර පිහිටුවා ඇති රිච්මන්ඩ් කන්ද නියෝජ්‍යස්ථානයේ නියෝජිත (ගමනාගමන) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අඩුම කොමිස් දීමනාව රු. 160 කි.

අයදුම් කළ හැක්කේ පිරිමි අපේක්ෂකයින්ට පමණකි. ඔවුන් මෙම නියෝජ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ එහි නිත්‍ය අයිතිවාසිකම් ඇත්තවුන් හෝ පළාත්වාසීන් විය යුතුය. එසේම ඔවුන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි වූවන් විය යුතුය.

අයදුම්කරුවන් යටත් පිරිසෙයින් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.

කොළඹ 10, මරදානේ, ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සාමාන්‍යාධිකාරි වෙතින් ලබාගත හැකි ඉල්ලුම් පත් නිසි පරිදි සම්පූර්ණකර 1973. 06. 12 වැනි දිනට හෝ ඊට පෙර, ඔහු වෙත ලැබෙන්න සැලැස් විය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා සෑම අයදුම්කරුවකු විසින්ම 9"×4" ප්‍රමාණයේ මුද්දර නොගැසූ තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවිය යුතුය. පිටත කවරයෙහි වම් පස මුදුනෙහි "දුම්රිය නියෝජිත (ගමනාගමන) තනතුර, රිච්මන්ඩ් කන්ද සඳහා අයදුම් පත" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

තවදුරටත් විස්තර අවශ්‍යනම්, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයන්හි පළ කෙරෙන දැන්වීම් මඟින් ලබා ගත හැකි වනු ඇත.

වී. තී. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

5-607/2—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා බනිජ වැලි සංයුක්ත මණ්ඩලය

පුල්මුඩේ ව්‍යාප්ති යෝජනා ක්‍රමය

පහත විස්තර ඇති තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) **ගණකාධිකාරි:** වැටුප් පරිමාණය—රු. 1,000—7×45—රු. 1,315. (සියලු දීමනා ඇතුළත් මාසික වැටුප).

**සුදුසුකම්.**—වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි මධ්‍ය පරීක්ෂණය සහිතව වගකිවයුතු තනතුරක අවුරුදු තුනක පළපුරුද්ද තිබිය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු පුල්මුඩේ යන්ත්‍රාගාරයෙහි සේවයෙහි පිහිටුවනු ලැබේ.

(ii) **පොත් තබන්නා.**—(පුරප්පාඩු දෙකකි).

වැටුප් පරිමාණය.—රු. 450—5×20—රු. 550.

**සුදුසුකම්.**—ලන්ඩන්හි පොත් තබන්නන්ගේ ආයතනයෙහි අවසාන පරීක්ෂණය සහිතව පොත් තැබීමේ කටයුතු පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්ද තිබිය යුතුය.

තෝරා ගනු ලබන අයදුම් කරුවන් කොළඹ සේවයෙහි පිහිටුවනු ලැබේ. කෙසේ වුවත් තෝරාගනු ලබන අයදුම්කරුවන් පුලිමුඩේ යන්ත්‍රාගාරයට මාරු කිරීමේ අවශ්‍යතාව පැන නැගුණහොත් එබඳු අවස්ථාවක දී මාරු කිරීමට සංයුක්ත මණ්ඩලය බලය රඳවා ගනී.

(iii) **පිරිවැය ලිපිකරු (පුලිමුඩේ) වැටුප් පරිමාණය—**
රු. 450—5×20—රු. 550.

සුදුසුකම්.—පිරිවැය හා කළමනාකාරිත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි I හා II කොටස් වලින් සමත්ව, පිළිගත් නිෂ්පාදන ආයතනයෙක අවුරුදු 3 ක පළපුරුද්ද තිබිය යුතුය.

(iv) ගබඩාභාරකරු (පුලිමුඩේ)—

වැටුප් පරිමාණය.—රු. 575—5×25—රු. 700.

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හයකින් අවස්ථා දෙකකට නොවැඩි ගණනකදී ලැබූ සාමාර්ථය හෝ වඩා උසස් විභාගයක් සහිතව ඉංජිනේරු ගබඩා කටයුතු පිළිබඳව අවුරුදු 10ක පළපුරුද්ද තිබිය යුතු අතර ඉන් අවුරුදු 4ක් පරිපාලක තනතුරක වයෙහි විය යුතුය.

(v) සැලසුම්කරුවෝ (සිවිල් 2 : යාන්ත්‍රික 1)—

වැටුප් පරිමාණය.—රු. 600—6×40—රු. 840.

සුදුසුකම්.—ආධුනික සැලසුම්කරු සහතිකය සහිතව, සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 7ක පළපුරුද්ද.

හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය සහිතව සැලසුම් කිරීම පිළිබඳව අවුරුදු 10ක පළපුරුද්ද තිබිය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවනට පුලිමුඩේ සේවය කිරීමට සිදු විය හැකිය.

(v) ලිපිකරු—

වැටුප් පරිමාණය.—රු. 345—7×15—රු. 450.

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය අ. පො. ස. (සා. පෙ.) විභාගයේදී දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වීම හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම සහ පිළිගත් ආයතනයක අවුරුදු 8ක පළපුරුද්ද තිබීම. වාණිජ කටයුතු පිළිබඳ දැනුම ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

මෙම තනතුර කොළඹටය. කෙසේ වුවත්, තෝරා ගනු ලබන අයදුම්කරු අවශ්‍ය වුවහොත් එබඳු විටෙක පුලිමුඩේ ඉල්මනයිට් යන්ත්‍රාගාරයට මාරු කරනු ලැබීමේ අයිතිය සංයුක්ත මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

2. සේවා කොන්දේසි හා නියුක්ත කරවීමේ කොන්දේසි:

(අ) මෙම තනතුරු තාවකාලික වන අතර, එක් මාසයක් කලින් දැනුම් දීමෙන් සේවය නතර කරනු ලැබිය හැකිය;

(ආ) සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් වැටුපෙන් 6%ක් දායක මුදල් ගෙවිය යුතුය. සංයුක්ත මණ්ඩලයේ දායක මුදල 9% කි ;

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරු රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය.

(ඈ) වඩා උසස් සහතික පත්‍ර හා වැඩි පළපුරුද්ද ඇති අයදුම්කරුවන් ඉහත දක්වන ලද ඒ ඒ වැටුප් පරිමාණයන්හි සුදුසු තලයෙක පිහිටුවා පත් වීම් දීම ගැන සලකා බලනු ලැබේ;

(ඉ) තෝරාගනු ලබන අයදුම්කරුවනට සංයුක්ත මණ්ඩලයේ ස්ථාවර පත්වීම් ලැබීමට කිසිදු අයිතිවාසිකමක් නොමැතිය.

3. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, සංයුක්ත මණ්ඩලවලින් එවන අයදුම්පත් ඒ ඒ සංයුක්ත මණ්ඩලයන්හි සභාපතිවරුන් මගින් එවිය යුතුය.

4. සුදුසුකම් හා පළපුරුද්ද ආදිය පිළිබඳව විස්තර සටහන් සහිත අයදුම්පත්, 1973.06.08 දිනට හෝ ඊට පෙර, කොළඹ තැ. පෙ. 1212, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

ඉල්ලුම් කරනු ලබන තනතුරෙහි නම, ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ සඳහන් කළ යුතුය.

එස්. ඉගලහේවා.
ලේකම්/පිරිස් කළමනාකරු.

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,
167, ශ්‍රී විජුලසේන මාවත,
කොළඹ 10.
1973.05.10,

5-629—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ඇබෑර්තු

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

1. ප්‍රෝසස් ආටිස්වරුන් (මුද්‍රණ කර්මාන්තයේ 'ඒ' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 400—10×15—රු. 550. (සියලු දීමනා අඩංගු මාසික).

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

(3) අධ්‍යාපනික, කාර්මික සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා.—(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ ප්‍රෝසස් ආටිස් කෙනෙකු වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව සිටීම සහ ප්‍රෝසස් ආටිස් කෙනෙකු වශයෙන් වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම

2. ලිතෝ මැෂින් මයින්ඩර්වරුන් (මුද්‍රණ කර්මාන්තයේ 'ඒ' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 400—10×15—රු. 550. (සියලු දීමනා අඩංගු මාසික).

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

(3) අධ්‍යාපනික හා කාර්මික සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා.—(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ ලිතෝ මැෂින් මයින්ඩර් කෙනෙකු වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ ලිතෝ මැෂින් මයින්ඩර් කෙනෙකු වශයෙන් වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම.

3. ෆිල්ම් සෙටර් ඔපරේටර් (මුද්‍රණ කර්මාන්තයේ 'ඒ' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 400—10×15—රු. 550. (සියලු දීමනා අඩංගු මාසික).

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

(3) අධ්‍යාපනික, කාර්මික සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා.—(1) ජ්‍යෙෂ්ඨතා පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ ෆිල්ම් සෙටර් ඔපරේටර් කෙනෙකු වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ ෆිල්ම් සෙටර් ඔපරේටර් කෙනෙකු වශයෙන් වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම.

4. මොනෝ ටයිප් යතුරු පුවරු ක්‍රියාකරුවන්නා (දෙමළ/ඉංග්‍රීසි) (මුද්‍රණ කර්මාන්තයේ 'ඒ' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 400—10×15—රු. 550. (සියලු දීමනා අඩංගු මාසික).

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

(3) අධ්‍යාපනික, කාර්මික සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා.—(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ මොනෝ ටයිප් යතුරු පුවරු (දෙමළ/ඉංග්‍රීසි) ක්‍රියාකරුවෙකු වශයෙන් වසර 5ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ මොනෝ ටයිප් යතුරු පුවරු (දෙමළ/ඉංග්‍රීසි) ක්‍රියාකරුවකු වශයෙන් වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

5. මුද්‍රණ යන්ත්‍ර කාර්මිකයින් (මුද්‍රණ කර්මාන්තයේ 'ඒ' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 400—10×15—රු. 550. (සියලු දීමනා අඩංගු මාසික).

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

(3) අධ්‍යාපනික, කාර්මික සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා.—(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ මුද්‍රණ යන්ත්‍ර කාර්මිකයෙකු වශයෙන් වසර 5ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව තිබීම සහ මුද්‍රණ යන්ත්‍ර කාර්මිකයෙකු වශයෙන් වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම.

6. ප්ලේටන් මැෂින් මයින්ඩර්වරුන් (මුද්‍රණ කර්මාන්තයේ 'බී' පන්තිය).

(1) වැටුප් පරිමාණය.—රු. 380—8×15—රු. 500. (සියලු දීමනා අඩංගු මාසික)

(2) වයස් සීමාව.—අවුරුදු 25-40.

5. උපන් දිනය :— අවුරුද්ද :———— මාසය :———— දිනය :————.

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :———— මාසය :———— දින :————.

7. විවාහකද ? අවිවාහකද? යන වග :————.

8. අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගය/උපාධිය | වර්ෂය | විෂයයන් |
| --- | --- | --- |
| | | |

9. ප්‍රායෝගික පළපුරුද්ද :—

| දැරූ තනතුරු සහ කාර්‍යයන්ගේ ස්වභාවය | සේවයකළ ස්ථාන | කාලපරිච්ඡේද |
| --- | --- | --- |
| | | |

10. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර :————.
(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(ඇ) පත්වූ දිනය :————.
(ඈ) ස්ථිරද ? විශ්‍රාම වැටුප් සහිතද? තාවකාලිකද යන වග :————
(ඉ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්ද යන වග :————.
(ඊ) වැටුප් පරිමානය හා දැනට ලබන වැටුප :————.

11. ඔබ ගැන තොරතුරු විමසා දැනගතහැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :—
1. ————.
2. ————.

12. වෙනත් කරුණු :————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍යබව හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර දැන ගත්හොත් මා නුසුදුස්සකුවීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒබව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්තනම් ඔහු/ඇය පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව**

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

5–605—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### නාමාවලිය සහකාර තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල් සහ බහුතාක්ෂණික ආයතන යන්හි නාමාවලී සහකාර තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1973 ජූනි මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ උඩ වම් කෙළවරේ "නාමවලී සහකාර තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කරනු ලබන්නන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාව යන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයන් නම්, ආධුනික කාලසීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයක ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත්කරනු ලබන්නන් තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය : වාර්ෂිකව : රු. 3,000—24 × 90—රු. 5,160 යි.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසු කම් සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දැනට මත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ආ) සම්මාන 3 ක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සම්මාන 3 ක් සහිත විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ).

සහ

(ඇ) ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණය හෝ පිළිගත් ඊට සමාන හෝ උසස් පරීක්ෂණයකින් සමත් වී තිබිය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්ත මේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැළකිය යුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළ හොත් පමණක්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවෙකු විසින් ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින් ම මෙම අමාත්‍ය අංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත් වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වන්ට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථා වන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාර ගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික

(ඉ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට පත් කරනු ලැබීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක් (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මෙම සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි, මෙම අමාත්‍යාංශයේ ලේකම් ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකු ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අව ධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ගෙවුනු කළ, අයදුම්පත ලද බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය ඉටුනොකළ හොත්, තම අයදුම්පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 මැයි මස 15 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

නාමාවලි සහකාර කනතුරු

1. නම (මුලකුරු සහිතව) ———— මහතා /මහත්මිය /මෙනෙවිය

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.

(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද ? :————.

6. ජාතිය :————.

7. විවාහක ද, අවිවාහක ද යන වග :————.

8. උපන් දිනය :— අවුරුද්ද :——— මාසය :——— දිනය :————.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :————.

අවුරුදු :——— මාස :——— දින :———

9. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිරකරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

10. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | මාධ්‍යය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

11. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

12. පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස පළපුරුද්ද ඇතොත් :—

| ආයතනය | දෙපාර්තමේන්තු | දින සිට | දින දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර ස්ථිරද තාවකාලිකද | සිට දක්වා |
|---|---|---|---|
| | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද? (එසේ නම් විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස් ද, එසේ නොවේ නම් ඔබේ ණය තුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන වත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–664—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

#### අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය—1973

ඉහත සඳහන් විභාගය සඳහා අයදුම්පත් 1973 ජූලි මස 10 වැනි දින දක්වා භාර ගනු ලැබේ.

2. **පාසල් අයදුම්පත්.**—1972 දෙසැම්බර් විභාගයට අයදුම්කරුවන් ඉදිරිපත් කළ සියළුම පාසල්වලට 1973 ජූනි මස 20 වැනි දිනට පෙර තැපැල් කරනු ලැබේ. ඒ වන විට අයදුම්පත් ලැබී නැති පාසල් ප්‍රධානීන් තම පාසලින් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ගේ ගණන දක්වා අයදුම්පත් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ යුතුය. ප්‍රථම වතාවට අයදුම්කරුවන් ඉදිරිපත් කරන පාසල් ප්‍රධානීන් තම විදුහලේ අ. පො. ස. (සා. පෙ.) පන්තිය අනුමත කරමින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ද සහිතව, ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් ගණන දක්වෙන ලිපියකින් අයදුම්පත් ඉල්ලා එවිය යුතුය.

3. **බාහිර අයදුම්පත්.**—1973 ජූනි 16 වැනි දින සිට 27 වැනි දින තෙක් තැපැලෙන් නිකුත් කරනු ලැබේ. වම් පැත්තේ උඩ කෙළවරේ 'එස් 2' යනු සඳහන් කළ ලිපිනය ලියූ මුද්දර නොමැති දිග කවරයක් එවා ඉල්ලන සෑම කෙනෙකුටම මෙම අයදුම්පත් තැපැලෙන් ලබා ගත හැකි අතර, එසේ එවන කවරය සමග කිසිම ලිපියක් නොඑවිය යුතුය. මෙම අයදුම්පත් 1973 ජූලි මස 04 වන දින සිට 09 වන ද දක්වා කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයට පැමිණීමෙන් ද ලබාගත හැක. එක් අයදුම්කරුවකුට නිකුත් කරනු ලබන්නේ එක අයදුම්පතක් පමණි.

4. **පරණ අයදුම්පත් මෙම විභාගය සඳහා පාවිච්චි නොකළ යුතුය.**—පාසල් හා බාහිර අයදුම්කරුවන්ගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1973 ජූලි මස 10 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනවා ඇත

විභාගය 1973 දෙසැම්බර් මස 11 වන දින ආරම්භ වේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 මැයි මස 10 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදී ය.

5–655—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල යතුරු ලේඛනය පුහුණු කිරීමේ පන්ති

1973 අප්‍රේල් 27 දාතමින් යුතුව, 1973. 05. 11 වැනි දිනැති අංක 59 දරණ ගැසට් පත්‍රයේ පළවූ ඉහත සඳහන් දැන්වීමේ 1 ඡේදයේ "මේ පන්ති අවුරුද්දක් පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ." යන්න, "මේ පන්ති හය මසක පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ." යනුවෙන් සංශෝධනය විය යුතුය.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ
කොමසාරිස්.

1973 මැයි මස 14 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත,
කොළඹ 7.

5–606—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 76/1/12 (එම්සී)

## ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගය—1972

### සංශෝධනය

1972 දෙසැම්බර් මස 8 වැනි දින දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ 1973 ජනවාරි මස 5 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය මගින් පසුව සංශෝධනය කරනු ලැබූ, පූර්වෝක්ත විභාගය පිළිබඳ නිවේදනය පහත දැක්වෙන අන්දමට තවරදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) වාචික පරීක්‍ෂණය :—

නිවේදනයේ 10 වැනි ඡේදයේ වාචික පරීක්‍ෂණය පිළිබඳ (VI) වැනි උප ඡේදයේ අගට පහත සඳහන් වචන එකතු කළ යුතුය :—

"මෙම වාචික පරීක්‍ෂණයේ පරමාර්ථය වන්නේ, අපේක්‍ෂකයා විසින් පෙන්නුම් කරනු ලබන නායකත්වය පිළිබඳ ගුණාංග සහ ඔහුගේ සේවා වාර්තාව තක්සේරු කිරිම වේ. සේවා වාර්තා ප්‍රශංසනීය වන්නා වූ අපේක්‍ෂකයින් හට එම සේවය සම්බන්ධයෙන් ලකුණු දීමේ දී වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. ලිඛිත පරීක්‍ෂණයේ දී අපේක්‍ෂකයින් විසින් ලබා ගෙන ඇති ලකුණු, වාචික පරීක්ෂණය පවත්වන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු නොලැබේ."

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7,
1973 මැයි මස 15 වැනිද.

5–654—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 76/1/12/3 (එම්සී)

## ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය—1974 සිට ඉදිරියට

1974 දී සහ ඉන් පසුව පවත්වනු ලබන ඉහත සඳහන් බඳවා ගැනීමේ විභාගය සඳහා වූ විභාග පරිපාටිය වෙනස් කිරීමට තීරණය කර ඇත. විභාග පරිපාටිය පහත දැක්වෙන පරිදි වනු ඇත :—

(1) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය—අපේක්ෂකයාගේ, න්‍යායානුසාරී තර්කණ ශක්තීන් සහ වාචික සහ වාචික නොවන සංදර්භයක ඉදිරිපත් කර ඇති තොරතුරුවලින් තර්කානුකූල නිගමනවලට එළැඹීමේ දක්ෂතාවය පිළිබඳ තක්සේරුවක් කළ හැකි වනු වස් සකස් කැරුණු විනාඩි 60 ක කාලයක ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රය "බහු වරණ" ප්‍රශ්නයන්ගෙන් සමන්විත වේ. ... ... ලකුණු 200 යි.

(2) අවබෝධය—අවබෝධය සහ තියුණු බුද්ධිය සහිතව අපේක්ෂකයාගේ කියවීමේ දක්ෂතාවය පරීක්ෂා කිරීම සඳහා සකස් කැරුණු විනාඩි 90 ක කාලයක ප්‍රශ්න පත්‍රයකි. කෙටි පාඨ ගණනාවක් දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කරනු ලබන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපෙයි. අපේක්ෂකයා විසින් මින් වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන්, ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා හට එම පාඨයන්ගේ අර්ථය වටහා ගැනීමට හැකිවන අන්දම පරීක්ෂා කිරීමට ය. ... ... ලකුණු 100 යි.

(3) විෂයානුබද්ධ අධ්‍යයනය—අපේක්ෂකයාගේ නිර්මාණාත්මක කල්පනා ශක්තීන් සහ ගැටළු නිරාකරණය කිරීමේ දක්ෂතාවය පරීක්ෂා කිරීම සඳහා සකස් කැරුණු පැය දෙකක කාලයක ප්‍රශ්න පත්‍රයකි. විසඳුම් අවශ්‍ය වන්නාවූ, ගැටළුවක් හෝ ගැටළු හෝ විද්‍යාපාන අවස්ථා එකක් හෝ වැඩි ගණනක් අපේක්ෂකයා වෙත ඉදිරිපත් කැරේ. ... ... ලකුණු 100 යි.

(4) වාචික පරීක්ෂණය—මෙම වාචික පරීක්ෂණයේ පරමාර්ථය වන්නේ, අපේක්ෂකයා විසින් පෙන්නුම් කරනු ලබන නායකත්වය පිළිබඳ ගුණාංග සහ ඔහුගේ සේවා වාර්තාව තක්සේරු කිරීම වේ. සේවා වාර්තා ප්‍රශංසනීය වන්නාවූ අපේක්ෂකයින් හට එම සේවය සම්බන්ධයෙන් ලකුණු දීමේ දී වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් ලබා ගෙන ඇති ලකුණු වාචික පරීක්ෂණය පවත්වන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු නො ලැබේ. ... ලකුණු 200 යි.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1973 මැයි මස 15 වැනිදා.

5–665—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| මැයි | 73.05.04 | සිකුරාද | ... | 73.04.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.05.11 | සිකුරාද | ... | 73.05.02 | බදාදා | දවල් | 12.00 |
| | 73.05.18 | සිකුරාද | ... | 73.05.09 | බදාදා | දවල් | 12.00 |
| | 73.05.25 | සිකුරාද | ... | 73.05.15 | අඟහරුවාද | දවල් | 12.00 |
| ජූනි | 73.06.01 | සිකුරාද | ... | 73.05.23 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.08 | සිකුරාද | ... | 73.05.30 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.14 | බ්‍රහස්පතින්දා | ... | 73.06.06 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.22 | සිකුරාද | ... | 73.06.13 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.29 | සිකුරාද | ... | 73.06.20 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.